*සැ. යු.-* 2018.11.30 දින පළ වූ අංක 2,100 දරන *ගැසට් පත්‍රයේ* I:III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,101 - 2018 දෙසැම්බර් මස 07 වැනි සිකුරාදා - 2018.12.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 806 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 දෙසැම්බර් මස 28 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 දෙසැම්බර් මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

බස්නාහිර පළාත්බද කොළඹ (සිවිල් බලය ක්‍රියාත්මක කරන) මහාධිකරණයේ දී ය

1995 අංක 11 දරන බේරුම්කරණ පනතේ vii වන කොටසේ 31 (1) වගන්තිය යටතේ තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවේ යෙදවීම සඳහා මහාධිකරණයෙන් ඉල්ලීමේ කාරණාව සම්බන්ධයෙනි.

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී,
ප්‍රධාන කාර්යාලය,
අංක 1161, මරදාන පාර, කොළඹ 08.

*..............................පෙත්සම්කරු.*

*කොළඹ වාණිජ මහාධිකරණය*
*නඩු අංකය :* CHC/608/17/ARB
*ඇස්කීසි අංකය :* 43/2018

*එදිරිව*

ඇන්තනි හෙට්ටිගේ සැම්සන් දියෙස්
නො. 465/4, අතුරුගිරිය පාර, අරංගල, හෝකන්දර.

*............................වගඋත්තරකරු.*

ඉහත නම් සඳහන් විත්තිකරු වෙත ය,

වර්ෂ 2018 ක් වූ මැයි මස 16 වැනි දින ඉහත අංක දරන නඩුවේ නියත කර ඇති සමථ තීන්දු ප්‍රකාශය ප්‍රකාර එනම්, අවසාන සමථයක් වශයෙන් සම්පූර්ණ ගෙවිය යුතු මුදල රු. 25,583,864 බවට දෙපාර්ශවය එකඟ වේ. එය මාස 60 කින් ගෙවීමට වගඋත්තකරු එකඟ වූ බවට ආඥාකොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද,

වාරික 1 සිට වාරික 32 දක්වා රු. 327,841 බැගින් සහ වාරික 33 සිට වාරික 60 දක්වා රු. 539,034 බැගින් ද වාරික ගෙවීමට වගඋත්තකරු එකඟ වූ බවට ආඥා කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

පළමු වාරිකය 2017 ජුනි මස 20 වන දිනෙන් පටන් ගෙන අවසන් වාරිකය වර්ෂ 2022 මැයි මස 20 වන දින වන විට ගෙවා නිම කිරීමට වගඋත්තකරු එකඟ වූ බවට ආඥා කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද,

ඉහත එකඟ වූ පරිදි ගෙවීම නොසලකා හැරියහොත් සහ/හෝ පැහැර හැරියහොත් මෙකී සමථය කඩකලාසේ සලකා මෙතෙක් ගෙවා ඇති සියලු මුදල් අඩුකොට මුල් ගිවිසුමට අනුව මුල්‍ය බදු නීතිය යටතේ අදාළ වාහනය නැවත ලබා ගැනීමටත්, අවුරුද්දක් ගත වුව ද ඉතිරි මුදල් ලබා ගැනීම සඳහා වර්ෂ 2018.05.16 දින දෙන ලද බේරුම්කරණය ප්‍රදානය ක්‍රියාත්මක කොට ඇස්කීසි ගැනීමට ඉල්ලුම්කාර සමාගමට අයිතියක් ඇති බවටත් ඒ සඳහා වැයවන සම්පූර්ණ මුදල වගඋත්තකරු විසින් දැරීමටත් ගිවිසුමේ පරිදි දඩ පොළිය ගෙවීමටත් වගඋත්තරකරු එකඟ වූ බවට ආඥාකොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද,

එසේම, විත්තිකරු විසින් සමථය ප්‍රකාර ගෙවීම් පැහැර හරින ලද හෙයින් තීන්දු ප්‍රකාශිත මුදලින්, ගෙවූ මුදල වන රුපියල් විසිහත්ලක්ෂ තිස්හතරදහස් හත්සිය හැත්තෑතුනක (රු.2,734,773.00) මුදල අඩුකොට ඉතිරි මුලු මුදල අයකර ගැනීම සඳහා,

එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කීසියේ බලය පිට ඉහත නම් සඳහන් විත්තිකරු වන ඇන්තනී හෙට්ටිගේ සැම්සන් දියෙස් යන අයට අයත් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළෙහි හිමිකම්, අයිතිවාසිකම් හා ඊට අදාළ සෑම සියලු දේ, ප්‍රසිද්ධ නොතාරිස් බී. එම්. අල්මේදා මහත්මිය විසින් 2016 ඔක්තෝබර් මස 04 වන දින පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී වෙත ලියා සහතික කර ඇති අංක 885 දරන උකස්කරයට හා කොළඹ වාණිජ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා විසින් වර්ෂ 2018 ක් වූ ඔක්තෝබර් මස 23 වෙනි දින කර ඇති තහනමට යටත් ව,

වර්ෂ 2019 ක් වූ ජනවාරි මස 10 වන දින පස්වරු 2.00 ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*දේපලට පිවිසීම.-* මෙම ඉඩම මාලඹේ නගරයේ සිට ගොඩගම පාර (අතුරුගිරිය පාර) ඔස්සේ කි. මී. 1.15 පමණ ගමන් කරන විට මෙම දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් (i) ගැණුම් මිළෙන් සියයට විසිපහක් (25%) ද, (ii) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියට (අ) යටතේ අයකිරීම් ද, (iii) විකුණුම් සඳහා වන සියලුම වියදම් මුදලින් ගෙවිය යුතුය. ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑපහ (75%) ක් වූ මුදල විකුණුම් දින සිට දින තිහක් (30) ඇතුළත එකී නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතුයි.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල නගර සභා සීමාව තුළ පිහිටි කඩුවෙල පළාත් ලේකම් කොට්ඨාසයට අයත්, අංක 476 B, මාලඹේ උතුර ග්‍රාම නිලධාරි වසමෙහි මාලඹේ ගමෙහි පිහිටි ''ගල්පොත්තවත්ත *හෙවත්* පැලැන්ගහවත්ත'' නමැති ඉඩමේ අවසරලත් මිනින්දෝරු ඩී. ටී. ඒ. දිසානායක මහතා විසින් වර්ෂ 2005.05.18 වන දින දී මැන සැදූ අංක 2296 දරන පිඹුරෙහි නිරූපිත කැබලි අංක ''01''මායිම් :

| | | |
|---|---|---|
| උතුරට | : | මාලඹේ සිට අතුරුගිරිය දක්වා ඉහළ පාර ද, |
| නැගෙනහිරට | : | චාල්ස් දියෙසේගේ උරුමකරුවන්ගේ ඉඩම ද, |
| දකුණට | : | පරණ පාර ද, |
| බස්නාහිරට | : | පිඹුරු අංක 255/211 හි කබැලි අංක A දරන ගුණසේනගේ උරුමකරුවන්ට අයත් ඉඩම ද, |

යන මායිම් අතර පිහිටි රූඩ් 02 පර්චස් දහතරයි දශම තුනක් (අ. 0, රූ. 2, පර්. 14.3) විශාල බිම් ප්‍රමාණය සහ ඒ තුළ පිහිටි සෑම සියලු දේද වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පිඹුරු අංක 2296 යටතේ G1917/65 දරන පත්ඉරුවෙහි ලියාපදිංචි වී ඇත.

ඉහත සවිස්තරව සඳහන් කැබලි අංක 01 දරන කොටස පහත සඳහන් පරිදි නැවත මැන සාදන ලදී.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල නගර සභා සීමාව තුළ පිහිටි කඩුවෙල පළාත් ලේකම් කොට්ඨාසයට අයත්, අංක 476B , මාලඹේ උතුර ග්‍රාම නිලධාරි වසමෙහි මාලඹේ ගමෙහි පිහිටි ''ගල්පොත්තවත්ත *හෙවත්* පැලැන්ගහවත්ත'' නමැති ඉඩමේ අවසරලත් මිනින්දෝරු ජේ. පී. රාමචන්ද්‍ර මහතා විසින් වර්ෂ 1973.05.17 වන දින දී මැන සෑදූ අංක 255/211 දරන පිඹුරෙහි නිරූපිත කැබලි අංක ''B'' මායිම් උතුරට : ප්‍රධාන පාර ද, නැගෙනහිරට : චාල්ස් දියෙස්ට අයත් ඉඩම ද, දකුණට : පාර ද බස්නාහිරට : පිඹුරු අංක 255/211 හි කැබලි අංක A දරන කොටස ද, යන මායිම් අතර පිහිටි රූඩ් 02 පර්චස් දාහතයි දශම හතරක් (අ. 0, රූ. 2, පර්. 17.4) විශාල බිම් ප්‍රමාණය සහ ඒ තුළ පිහිටි සෑම සියලු දේද වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පිඹුරු අංක 255/211 යටතේ GB 411/57 දරන පත්ඉරුවෙහි ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩම දැනට හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක B 411/113 දරන පත් ඉරුවෙහි ලියාපදිංචි වී ඇත.

බී. ජේ. ෆිලානි ද සිල්වා,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
වාණිජ මහාධිකරණය, කොළඹ.

වර්ෂ 2018 ක් වූ නොවැම්බර් මස 27 වැනි දින දී ය.

12-224

---

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

බස්නාහිර පළාත්බද කොළඹ (සිවිල් බලය ක්‍රියාත්මක කරන) මහාධිකරණයේ දී ය

*කොළඹ වාණිජ මහාධිකරණය*
*නඩු අංකය* : CHC/607/17/ARB
*ඇස්කිසි අංකය* : 34/2018

1995 අංක 11 දරන බේරුම්කරණ පනතේ vii වන කොටසේ 31(1) වගන්තිය යටතේ තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවේ යෙදවීම සඳහා මහාධිකරණයෙන් ඉල්ලීමේ කාරණාව සම්බන්ධයෙනි.

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී,
ප්‍රධාන කාර්යාලය, අංක 1161, මරදාන පාර, කොළඹ 08.

.........................................*පෙත්සම්කරු.*

*එදිරිව*

ඇන්තනි හෙට්ටිගේ සැම්සන් දියෙස්,
නො. 465/4, අතුරුගිරිය පාර, අරංගල, හෝකන්දර.

............................................ *වගඋත්තරකරු.*

ඉහත නම් සඳහන් විත්තිකරු වෙත ය,

වර්ෂ 2018 ක්වූ මැයි මස 16 වැනි දින ඉහත අංක දරන නඩුවේ නියත කර ඇති සමථ තීන්දු ප්‍රකාශය ප්‍රකාර එනම්,

අවසාන සමථයක් වශයෙන් සම්පූර්ණ ගෙවිය යුතු මුදල රු. 33,065,368 බවට දෙපාර්ශවය එකඟ වේ. එය මාස 60 කින් ගෙවීමට වගඋත්තරකරු එකඟ වූ බවට ආඥා කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද,

වාරික 1 සිට වාරික 32 දක්වා රු. 426,601 බැගින් සහ වාරික 33 සිට වාරික 60 දක්වා රු. 693,362 බැගින් ද වාරික ගෙවීමට වගඋත්තරකරු එකඟ වූ බවට ආඥා කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

පළමු වාරික 2017 ජුනි මස 10 වැනි දිනෙන් පටන් ගෙන අවසන් වාරිකය වර්ෂ 2022 මැයි මස 10 වන දින වන විට ගෙවා නිම කිරීමට වගඋත්තරකරු එකඟ වූ බවට ආඥා කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද,

ඉහත එකඟ වූ පරිදි ගෙවීම නොසලකා හැරියහොත් සහ/හෝ පැහැර හැරියහොත් මෙකී සමථය කඩකලාසේ සලකා මෙතෙක් ගෙවා ඇති සියලු මුදල් අඩුකොට මුල් ගිවිසුමට අනුව මූල්‍ය බදු නීතිය යටතේ අදාළ වාහනය නැවත ලබා ගැනීමටත්, අවුරුද්දක් ගත වුව ද ඉතිරි මුදල් ලබා ගැනීම සඳහා වර්ෂ 2018.05.16 වැනි දින දෙන ලද බේරුම්කරණ ප්‍රදානය ක්‍රියාත්මක කොට ඇස්කීසි ගැනීමට ඉල්ලුම්කාර සමාගමට අයිතියක් ඇති බවටත් ඒ සඳහා වැය වන සම්පූර්ණ මුදල 1 වන වගඋත්තරකරු විසින් දැරීමටත් ගිවිසුමේ පරිදි දඩ පොළිය ගෙවීමටත් 1 වන වගඋත්තරකරු එකඟ වූ බවට ආඥා කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද,

විත්තිකරු විසින් සමථය ප්‍රකාර ගෙවීම පැහැර හරින ලද හෙයින් තීන්දු ප්‍රකාශිත මුදලින්, ගෙවූ මුදල වන රුපියල් විසිදෙලක්ෂ හතළිස්හයදහස් අටසිය තුනක (රු.2,246,803.00) මුදල අඩුකොට ඉතිරි මුදල අයකර ගැනීම සඳහා,

එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කීසියේ බලය පිට ඉහත නම් සඳහන් විත්තිකරු වන ඇන්තනි හෙට්ටිගේ සැම්සන් දියෙස් යන අයට අයත් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළෙහි හිමිකම්, අයිතිවාසිකම් හා ඊට අදාළ සෑම සියලුදේ, ප්‍රසිද්ධ නොතාරිස් හර්ෂනී ඩයස් අමරතුංග මහත්මිය විසින් 2015 අගෝස්තු මස 12 වන දින පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී වෙත ලියා සහතික කර ඇති අංක 145 දරන උගස්කරයට හා කොළඹ වාණිජ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා විසින් වර්ෂ 2018 ක් වූ අගෝස්තු මස 10 වෙනි දින කර ඇති තහනමට යටත්ව, වර්ෂ 2019 ක් වූ ජනවාරි මස 10 දින පස්වරු 2.00 ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*දේපළ පිහිටීම.*- මෙම ඉඩම මාලඹේ නගරයේ සිට ගොඩගම පාර (අතුරුගිරිය පාර) ඔස්සේ කි. මී. 1.15 පමණ ගමන් කරන විට මෙම දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් (i) ගැණුම් මිලෙන් සියයට විසිපහක් (25%) ද, (ii) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තිය (අ) යටතේ අයකිරීම් ද, (iii) විකුණුම් සඳහා වන සියලුම වියදම් මුදලින් ගෙවිය යුතුය. ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑපහ (75%) ක් වූ මුදල විකුණුම් දින සිට දින තිහක් (30) ඇතුළත එකී නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතුයි.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල නගර සභා සීමාව තුළ පිහිටි කඩුවෙල පළාත් ලේකම් කොට්ඨාසයට අයත්, අංක 476B, මාලඹේ උතුර ග්‍රාම නිලධාරී වසමෙහි මාලඹේ ගමෙහි පිහිටි 'ගල්පොත්තවත්ත *හෙවත්* පැලැන්ගහවත්ත'' නැමති ඉඩමේ අවසරලත් මිනින්දෝරු ඩී. ටී. ඒ. දිසානායක මහතා විසින් වර්ෂ 2005.05.18 වැනි දින දී මැන සෑදූ අංක 2296 දරන පිඹුරෙහි නිරූපිත කැබලි අංක ''01'' මායිම්,

| | | |
|---|---|---|
| උතුරට | : | මාලඹේ සිට අතුරුගිරිය දක්වා ඉහළ පාර ද, |
| නැගෙනහිරට | : | චාල්ස් දියෙස්ගේ උරුමකරුවන්ගේ ඉඩම ද, |
| දකුණට | : | පරණ පාර ද, |
| බස්නාහිරට | : | පිඹුරු අංක 255/211 හි කැබලි අංක A දරන ගුණසේනගේ උරුමකරුවන්ට අයත් ඉඩම ද, |

යන මායිම් අතර පිහිටි රූඩ් දෙකයි පර්චස් දාහතරයි දශම තුනක් (අ.0, රූ. 2, පර්. 14.3) විශාල බිම් ප්‍රමාණය සහ ඒ තුළ පිහිටි සෑම සියලු දේද වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පිඹුරු අංක 2296 යටතේ G1917/65 දරන පත්ඉරුවෙහි ලියාපදිංචි වී ඇත.

ඉහත සවිස්තරව සඳහන් කැබලි අංක 01 දරන කොටස පහත සඳහන් පරිදි නැවත මැන සාදන ලදී :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල නගර සභා සීමාව තුළ පිහිටි කඩුවෙල පළාත් ලේකම් කොට්ඨාසයට අයත්, අංක 476B, මාලඹේ උතුර ග්‍රාම නිලධාරී වසමෙහි මාලඹේ ගමෙහි පිහිටි ''ගල්පොත්තවත්ත *හෙවත්* පැලැන්ගහවත්ත'' නමැති ඉඩමේ අවසරලත් මිනින්දෝරු ජේ. පී. රාමචන්ද්‍ර මහතා විසින් වර්ෂ 1973.05.17 වැනි දින දී මැන සෑදූ අංක 255/211 දරන පිඹුරෙහි නිරූපිත කැබලි අංක ''B'' මායිම්,

උතුරට : ප්‍රධාන පාර ද, නැගෙනහිරට : චාල්ස් දියෙස්ට අයත් ඉඩම ද, දකුණට : පාර ද, බස්නාහිරට : පිඹුරු අංක 255/211 හි කැබලි අක්ෂර A දරන කොටස ද, යන මායිම් අතර පිහිටි රූඩ් දෙකයි පර්චස් දාහතයි දශම හතරක් (අ. 0, රූ. 2, පර්. 17.4) විශාල බිම් ප්‍රමාණය සහ ඒ තුළ පිහිටි සෑම සියලු දේ ද වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පිඹුරු අංක 255/211 යටතේ GB 411/57 දරන පත්‍රිරුවෙහි ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩම දැනට හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක B411/113 දරන පත්‍රිරුවෙහි ලියාපදිංචි වී ඇත.

බී. ජේ. ෆිලානි ද සිල්වා,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
වාණිජ මහාධිකරණය,
කොළඹ.

වර්ෂ 2018 ක් වූ නොවැම්බර් මස 27 වැනි දින දී ය.

12-225

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

බස්නාහිර පළාත්බද කොළඹ (සිවිල් බලය ක්‍රියාත්මක කරන) මහාධිකරණයේ දී ය

1995 අංක 11 දරන බේරුම්කරණ පනතේ vii වන කොටසේ 31(1) වගන්තිය යටතේ තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවේ යෙදවීම සඳහා මහාධිකරණයෙන් ඉල්ලීමේ කාරණාව සම්බන්ධයෙනි.

පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී,
ප්‍රධාන කාර්යාලය, අංක 1161, මරදාන පාර, කොළඹ 08.

..................................*පෙත්සම්කරු.*

*කොළඹ වාණිජ මහාධිකරණය*
*නඩු අංකය* : CHC/609/17/ARB
*ඇස්කීසි අංකය* : 42/2018

*එදිරිව*

ඇන්තනි හෙට්ටිගේ සැම්සන් දියෙස්,
අංක 465/4, අතුරුගිරිය පාර, අරංගල, හෝකන්දර.

..................................*වගඋත්තරකරු.*

ඉහත නම් සඳහන් විත්තිකරු වෙත ය,

වර්ෂ 2018 ක් වූ මැයි මස 17 වැනි දින ඉහත අංක දරන නඩුවේ නියත කර ඇති සමථ තීන්දු ප්‍රකාශය ප්‍රකාර එනම්,

අවසාන සමථයක් වශයෙන් සම්පූර්ණ ගෙවිය යුතු මුදල රු. 111,204,060 බවට දෙපාර්ශවය එකඟ වේ. එය මාස 60 කින් ගෙවීමට වගඋත්තරකරු එකඟ වූ බවට ආඥා කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද,

වාරික 1 සිට වාරික 32 දක්වා රු. 1,152,967 බැගින් සහ වාරික 33 සිට වාරික 60 දක්වා රු. 2,653,897 බැගින් ද වාරික ගෙවීමට වගඋත්තරකරු එකඟ වූ බවට ආඥා කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද, පළමු වාරිකය 2017 ජුනි මස 01 වැනි දිනෙන් පටන් ගෙන අවසන් වාරිකය වර්ෂ 2022 මැයි මස 20 වැනි දින වන විට ගෙවා නිම කිරිමට වගඋත්තකරු එකඟ වූ බවට ආඥා කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද,

ඉහත එකඟ වූ පරිදි ගෙවීම නොසලකා හැරියහොත් සහ/හෝ පැහැර හැරියහොත් මෙකී සමථය කඩකලාසේ සලකා මෙතෙක් ගෙවා ඇති සියලු මුදල් අඩුකොට මුල් ගිවිසුමට අනුව මූල්‍ය බදු නීතිය යටතේ අදාළ වාහනය නැවත ලබා ගැනීමටත් අවුරුද්දක් ගත වුවද ඉතිරි මුදල් ලබා ගැනීම සඳහා වර්ෂ 2018.05.17 වැනි දින දෙන ලද බේරුම්කරණය ප්‍රදානය ක්‍රියාත්මක කොට ඇස්කීසි ගැනීමට ඉල්ලුම්කාර සමාගමට අයිතියක් ඇති බවටත් ඒ සඳහා වැය වන සම්පූර්ණ මුදල වගඋත්තරකරු විසින් දැරීමටත් ගිවිසුමේ පරිදි දඩ පොලිය ගෙවීමටත් වගඋත්තරකරු එකඟ වූ බවට ආඥා කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද,

විත්තිකරු විසින් සමථය ප්‍රකාර ගෙවීම් පැහැර හරින ලද හෙයින් තීන්දු ප්‍රකාශිත මුදලින්, ගෙවූ මුදල වන රුපියල් හතලිස් හයලක්ෂ එකොළොස්දහස් නවසිය එකක (රු.4,611,901.00) මුදල අඩුකොට ඉතිරි මුලු මුදල අයකර ගැනිම සඳහා,

එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කීසියේ බලය පිට ඉහත නම් සඳහන් විත්තිකරු වන ඇන්තනී හෙට්ටිගේ සැම්සන් දියෙස් යන අයට අයත් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළෙහි හිමිකම්, අයිතිවාසිකම් හා ඊට අදාල සැම සියලු දේ, ප්‍රසිද්ධ නොතාරිස් හර්ෂනී ඩයස් අමරතුංග මහත්මිය විසින් 2015 අගෝස්තු මස 12 වැනි දින පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී වෙත ලියා සහතික කර ඇති අංක 146 දරන උකස්කරය හා කොළඹ වාණිජ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා විසින් අනුව වර්ෂ 2018 ක් වූ ඔක්තෝබර් මස 23 වැනි දින කර ඇති තහනමට යටත්ව,

වර්ෂ 2019 ක් වූ ජනවාරි මස 10 වැනි දින පස්වරු 2.00 ට එකී දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*දේපළ පිහිටීම*.- මෙම ඉඩම මාලඹේ නගරයේ සිට ගොඩගම පාර (අතුරුගිරිය පාර) ඔස්සේ කි. මී. 1.15 පමණ ගමන් කරන විට මෙම දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් (i) ගැණුම් මිළෙන් සියයට විසිපහක් (25%) ද, (ii) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තිය (අ) යටතේ අයකිරීම් ද, (iii) විකුණුම් සඳහා වන සියලුම වියදම් මුදලින් ගෙවිය යුතුය. ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑපහ (75%) ක් වූ මුදල විකුණුම් දින සිට දින තිහක් (30) ඇතුළත එකී නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතුයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල නගර සභා සීමාව තුළ පිහිටි කඩුවෙල පළාත් ලේකම් කොට්ඨාසයට අයත්, අංක 476 B මාලඹේ උතුර ග්‍රාම නිලධාරී වසමෙහි මාලඹේ ගමෙහි පිහිටි ''ගල්පොත්තවත්ත *හෙවත්* පැලැන්ගහවත්ත'' නැමති ඉඩමේ අවසරලත් මිනින්දෝරු ඩී. ටී. ඒ. දිසානායක මහතා විසින් වර්ෂ 2005.05.18 වැනි දින දී මැන සෑදූ අංක 2296 දරන පිඹුරෙහි නිරූපිත කැබලි අංක ''01'' මායිම් :

| | |
|---|---|
| උතුරට | : මාලඹේ සිට අතුරුගිරිය දක්වා ඉහළ පාර ද, |
| නැගෙනහිරට | : චාල්ස් දියෙස්ගේ උරුමකරුවන්ගේ ඉඩම ද, |
| දකුණට | : පරණ පාර ද, |
| බස්නාහිරට | : පිඹුරු අංක 255/211 හි කැබලි අංක A දරන ගුණසේනගේ උරුමකරුවන්ට අයත් ඉඩම ද, |

යන මායිම් අතර පිහිටි රූඩ් දෙකයි පර්චස් දාහතරයි දශම තුනක් (අ. 0, රූ. 2, පර්. 14.3) විශාල බිම් ප්‍රමාණය සහ ඒ තුළ පිහිටි සැම සියලු දේ ද වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ පිඹුරු අංක 2296 යටතේ G1917/65 දරන පත්ඉරුවෙහි ලියාපදිංචි වී ඇත.

ඉහත සවිස්තරව සඳහන් කැබලි අංක 01 දරන කොටස පහත සඳහන් පරිදි නැවත මැන සාදන ලදී :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල නගර සභා සීමාව තුළ පිහිටි කඩුවෙල පළාත් ලේකම් කොට්ඨාසයට අයත්, අංක 476B, මාලඹේ උතුර ග්‍රාම නිලධාරී වසමෙහි මාලඹේ ගමෙහි පිහිටි ''ගල්පොත්තවත්ත *හෙවත්* පැලැන්ගහවත්ත'' නමැති ඉඩමේ අවසරලත් මිනින්දෝරු ජේ. පී. රාමචන්ද්‍ර මහතා විසින් වර්ෂ 1973.05.17 වැනි දින දී මැන සෑදූ අංක 255/211 දරන පිඹුරෙහි නිරූපිත කැබලි අංක ''B'' මායිම්, උතුරට : ප්‍රධාන පාර ද, නැගෙනහිරට : චාල්ස් දියෙස්ට අයත් ඉඩම ද, දකුණට : පාර ද, බස්නාහිරට : පිඹුරු අංක 255/211 හි කැබලි අංක ''A'' දරන කොටස ද, යන මායිම් අතර පිහිටි රූඩ්

දෙකයි පර්චස් දාහතරයි දශම හතරක් (අ.0, රූ. 2, පර්. 17.4) විශාල බිම් ප්‍රමාණය සහ ඒ තුළ පිහිටි සෑම සියලු දේ ද වේ. මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පිඹුරු අංක 255/211 යටතේ GB 411/57 දරන පත්‍රිරුවෙහි ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩම දැනට හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ අංක B411/87 දරන පත්‍රිරුවෙහි ලියාපදිංචි වී ඇත.

බී. ජේ. හිලානි ද සිල්වා,<br>
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,<br>
වාණිජ මහාධිකරණය,<br>
කොළඹ.

වර්ෂ 2018 ක් වූ නොවැම්බර් මස 27 වැනි දින දී ය.

12-226

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | | *තැපැල් ගාස්තුව* | |
|---|---|---|---|---|
| | *රු.* | *ශ.* | *රු.* | *ශ.* |
| I වැනි කොටස : | | | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 | 0 | 9,340 | 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 | 0 | 950 | 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 | 0 | 750 | 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 | 0 | 2,500 | 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 | 0 | 450 | 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 | 0 | 275 | 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 | 0 | 4,360 | 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 | 0 | 3,640 | 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 | 0 | 1,250 | 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 | 0 | 5,520 | 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | | **තැපැල් ගාස්තුව** | |
|---|---|---|---|---|
| I වැනි කොටස : | *රු.* | *ශ.* | *රු.* | *ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 | 0 | 60 | 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 | 0 | 60 | 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 | 0 | 60 | 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 | 0 | 120 | 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 | 0 | 60 | 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 | 0 | 60 | 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 | 0 | 60 | 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 | 0 | 60 | 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 | 0 | 60 | 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2018 වර්ෂය** | | | |
| **දෙසැම්බර්** | 2018.12.07 | සිකුරාදා | 2018.11.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.12.14 | සිකුරාදා | 2018.11.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.12.21 | සිකුරාදා | 2018.12.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.12.28 | සිකුරාදා | 2018.12.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2019 වර්ෂය** | | | |
| **ජනවාරි** | 2019.01.04 | සිකුරාදා | 2018.12.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.01.11 | සිකුරාදා | 2018.12.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.01.18 | සිකුරාදා | 2019.01.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.01.25 | සිකුරාදා | 2019.01.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2019.02.01 | සිකුරාදා | 2019.01.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.02.08 | සිකුරාදා | 2019.01.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.02.15 | සිකුරාදා | 2019.02.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.02.22 | සිකුරාදා | 2019.02.08 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2018 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.